## මල් පෙති තරම් සියුමැලි තුරුපත්‍ය

**මහේෂි බී. වීරකෝන්**

ඉඳුදුන්නෙ හුය ලිහුණු ඉසිඹුවක
සියක් පැහැ පිනිවලට අත් විසුල
පතන් බිම් පුරා පිපි මල් පමණක්ද...,

මල් පෙති තරම් සියුමැලි
ඒ තරමටම සියුම් පැහැ ඇති
ලා රතු වසත් තුරුපත් දැක ඇතිද...?

නිල් අහස් වලා මත සීත අත්තටු අතුල
තරු පාලමක් මතට වී තුඩින් තුඩ සිපගන්න
රන් පාට විහගුන් විතරක්ද...,

හිරු රැස් උරා සැනහෙන
තණ ගුල්ම මත උණුහුමට ගුලිවෙන
දින ගෙවී යන තුරු සිහින් සර ගී කියන
බඩවැටි අතර දිවයන රැහැයි පෙම්වතුන් නම් කීයක්ද ...?

ළතඹ ගංතෙර ගොම්මනක ඉපදුන
නමක් නැති ප්‍රේමයක්...,
ඉතින් කෙදිනවත් නුඹ දැක නැතිද...?



## විසිරි මතක

**සුපුන් අතුකෝරල**

විසිරි මතකයන් ආයෙත් මුණගැසෙන
සැමරුම් බිමකි තවමත් මේ වැව රවුම
වෙනස් වුවද මගතොට මේ හුරු අහස
අවදි නොවූ ස්වපනයකි ආදරය

බිඳින් බිඳ වැටෙනා මේ නිලි වැස්ස
සියුම් කඩු කිනිති සේ රිදවයි හඳ මඩල
තැවුණ හිතම සෙනහසකින් පිරිමදින
කටහඬ ඔබේ ඇසෙනා මානයටත් දුරය

කොහේ වුනත් ඔබ සිටිනා නිම්තෙරට
මහදේ ගැස්ම මොහොතටවත් ඇසෙනවාද?
සමරන්නට තරම් අද දවසක් නැති හිතට
අතීතයම හිත නිවනා වදනක්ය

නොසිදී පිරී තිබෙනා මෙන් නුවර වැව
මගේ ප්‍රේමයත් නොසිදෙන වැවක් මෙන
එහි ගැඹුරත සැගවුණු ඔබ නෙළුම් මල
කිසිදා නොපිපි හිත රිදවන කවියක්ය

## ගමට එන්න

**පී.එම්.පතිරණ**

පාවි පාවි ගෑවි ගෑවි
කඳු මුදුනට හාදු දෙන්න
ඒ කුළු මැද මේකුළු වැද
මුතු දියබිඳු මල් සලන්න
තුරුහිස්වල මුදු පත්වල
ඒ දිය බිඳු විසිරවන්න

පිනිකැටසේ දිලිසි දිලිසි
ඉහලින් පහළට ඇදෙන්න

සිලිලාරේ සැගව නටා
ගං කොමලිගෙ ඇකයට පැන
නිල් වන පෙත් පවස නිවා
ඇල්ලෙන් පැන නිල්ල මැදින්
රන් දියවර තෑගි අරන්
සෙමින් සෙමින් ගමට එන්න




## මතක සිතුවම්

**ජයසේන කොඩිතුවක්කු**

දවසක් දා රැයක නිදි නැති වෙලාවක
සිත පැටලුනා මතකයෙ සිතුවිලි වැලක
වැලි කෙලියේ පටන් සිදුවුන හැම දේක
සිතුවම් පටය දිග හැරුණා එකින් එක

ගැමි සුවඳටයි අපි උපතින් පුරුදු වුනේ
සරු සාරවත් ගම "මලිදුව" ලක දකුණේ
කොස් දෙල් කැකුළු බත් එළවළු අඩු නූනේ
තුන් වේලටම අඩු නැතිවම බත පිරුණේ

වසරේ හැමදාම සිසිලැති දේශගුනේ
යල මහ දෙකම එක ලෙස සරුසාර වුනේ
තේ පොල් රබර් කඳු වැටි පෙළ හැඩ කෙරුනේ
ගම හැම දෙනාගේ අත මිට ඉන් සරු කෙරුනේ

නිල්වන් කුඹුරු යායෙන් වට වී තිබුන
පාසැල ගමේ අප හට නැණ සවි දුන්න
ගම මැද්දෙන් ගලා ගිය නිල් දිය පිරුන
"දිගිලි ගඟ" ගමට ආසිරි පැන් ඉසින

පොඩි පොඩි වැසි වළා තෙර නැහැ හැමදාම
හබරළ පිත්ත යට පාසැල් ගිය අරුම
නපුරක් වුනේ නැහැ ගං දිය ගැලුවාම
කුඹුරට ජලය සිල් මඩ ගෙන දෙයි බොහොම

රජමහ විහාරය ඇත ගම උසම තැන
ඝංටා නාදෙ රැව් දෙයි ගම හතර කොන
හේවිසි තේවාව නිසි ලෙද ඉටු කරන
පිරිසක් ගමේ සිටියා බෙර පද වයන

ගම මැද පිහිටි පුද බිමකිය අම්පිටිය
බෝ සමිඳුන් වටා ඉපැරණි රුක් පෙළය
අංගහ පිටිය මැද පිහිටිය මනහරය
ගම්මඩු උළෙල කාගෙත් සිත් පිනවීය

## සඳැසින් නිසඳැසට

**ඩබ් ජයන්ත ඇපා**

කෙම් බිම හමුවිය කතර මැදින් යන කල ජීවිත ගම නේ
තාලෙට නැළවෙන තාල වර්ගයක නෙරළු ගසක සෙවනේ
කිරුළ පැළඳගෙන මට රජවෙන්නට පුංචි රටකි මැවුනේ
දිවිය ම හැඩ විය එළිසම පිහිටපු සඳැස් කවක් ලෙසිනේ

තෙවසරක් පමණි ගෙවුනේ
නැවුම් බව මිලින වන්නට
හරිම ඒකාකාරී විය එළිසමය

නෙරළු ගස් ද අපුල වුන කල
ගම ගස් කරයට පැමිණියෙමි
මිහිර සොයා විවිධත්වයේ

දිවි රකින්ට මගක් ලැබුණි
ගත වෙහෙසා වැඩ කරමින්
හිත වෙහෙසන්නට පමණක් දත් මට
මහත් නුහුරකුයි දැනෙන්නේ

ලැබෙන වැටුප ඉස්තරම්ය
කුමටද ඔය හැටි තැවෙන්නේ
හරිම ඇත්ත කියනා දෙය
මා ප්‍රිය හිත මිතුරු සැවොම

ඉවසමි මෙම නුහුර
නවතා මැසිවිලි නැගිල්ල
ලත් පළමු නිවාඩුව ම
දිනයකි මව්දින සැමරුම්

පළමු වැටුප රැගෙන
යමි සාප්පු සවාරියේ
සත් ක්‍රියාවකි සාප්පු යාම
රැක ගත හැකිලු
රටේ ආර්ථිකයද එමගින්

"ආදරේ නැද්ද අම්මට ?"
ඇහුවේ නූතන වෙස්සන්තර කෙනෙක්
සියයට හැත්තෑවක් ඩිස්කවුන්ට් දී බඩු විකුණන
ඔහුගෙන් මිලදී ගත තෑග්ග
යවමි අම්මට තැපෑලෙන්
මව් දින ශුභ පැතුමක් ද සමගින්

පියෙකු මෙන් උදව් කළ
ගම ගස් කරය හුරු පුරුදු මිතුරෙක්
සමුගත්තේය දිවියෙන්
ඔහු පැරදුණි
ව්‍යාධි සමග කල සටනින්

ශාලාවක ඇති මල ගෙදරට යමි
හද රිදුම කඳුලට පෙරලන්නට
එහෙත් සිදුවුනේ මට
කොක් හඬ ලා සිනාසෙන්නට
අසා ඔහු කියා ඇති විහිලු අසා
ප්‍රීති වුනෙමි ඔහු ප්‍රිය කල ගීත අසා
නොදැනුනි දුකක් හිතට
දේහය දවන කල වුව
හිරි වැටුනද හදවත මගේ
නැතිනම්, කය මිස * හිත නැති බඹ ලොවටද
පැමිණි ඇත්තේ මා

නැවත වැඩට ගිය විට දැන ගතිමි
වැටුප තුන් ගුණයක් වී ඇති වග
වටහා ගන්නට ගතවුනේ මොහොතයි
එය අවසාන ගෙවුම බව
ගෙදර යන්න ඉගිළුන කල
ලකොහෙද යන්නේ ? ල යයි ඇසුවේ
සගයෙක් ය එකට වැඩ කල
"ගත වෙහෙසන්නට සුදුසු නැතිව වගෙයි මා
නැවත ඉගෙන ගන්න වෙයි වගේ මොනවා හරි"
පැවසුවෙමි ඇත්ත

"ඒක හින්ද නොවේ
ඉගන ගන්නවා එෆ් වර්ඩ්
යන්න වුනේ ඉක්මනින්
ඔබ එෆ් වර්ඩ් වලින් කතා නොකළ නිසා"

(පනහ පිරුන ) බෝයි කෙනෙක් ලෙස
යමි නැවත සරසවියට
කොතරම් අපුරුද
එහි එෆ් වඩ් උගන්නනවා නම්

මේ විසිතුරු සල් පිලේ
වෙළෙන්දෙක්මි මා පුංචිම පුංචි
යටත් වැසියෝ නැත
නැත කිරුළු ද නෙරලුකරේ රජ කම්
කරන කල මෙන්
දිවිය දැන් සඳැසකි
ගම ගසක් මෙන්
අතු විහිදුන සතර දිගන්තයට
හොඳට වැඩෙතත්

නොවේ එය කිසි තාලයකට
සඳැස් කවක් මෙන්
නමුත් එය පිරිපුන්ය
මා මිතුරු
විවිධත්වයෙන්